# පෝස්ටර් චිත්‍ර තරඟය

## 2004 එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සහල් වර්ෂය

## තේමාව : "සහල් අපගේ ජීවිතය වේ."

**මෙම තරඟය පහත පරිදි අංශ දෙකක් යටතේ පැවැත්වේ.**

1. **වැඩිහිටි (විවෘත)**
2. **පාසැල් ළමුන් (2004 අගෝස්තු 31 වන දිනට වයස අවු 18 ට අඩු)**

තරඟකරුවන්ට තම නිර්මාණය සඳහා සෙ. මී. 40×50 ප්‍රමාණයේ ඕනෑම කඩදාසි වර්ගයක් සහ ඕනෑම ඇඳීමේ මාධ්‍යයක් භාවිතා කළ හැකිය. නිර්මාණය පිටුපස තම සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, දුරකථන අංකය සඳහන් කළ යුතු අතර නිර්මාණය තමාගේ ස්වයං නිර්මාණයක් බවට තම අත්සන හා දිනය යෙදිය යුතුය.

තවද ඉහත කරුණු වලට අමතරව 2004 අගෝස්තු 31 වන දිනට වයස අවු: 18 ට අඩු පාසල් ළමුන්ගේ උපන් දිනය විදුහල්පතිතුමා විසින් නිර්මාණය පිටුපස තම අත්සන, දිනය සහ මුද්‍රාව යොදා සහතික කළ යුතුය.

**ත්‍යාග :**

**1) වැඩිහිටි පෝස්ටර් චිත්‍ර තරඟය**

* ප්‍රථම , දෙවන සහ තුන්වන ස්ථාන වලට පිළිවෙලින් රු. 5000/=, 2500/=, 1500/= බැගින් මුදල් ත්‍යාගද පදක්කමක් හා සහතිකයක් ද පිරිනැමේ.
* 4 සිට 10 දක්වා ස්ථාන වලට පදක්කමක් හා සහතිකයක් පිරිනැමේ

මීට අමතරව හොඳම නිර්මාණ වෙනුවෙන් සහතිකයක් පිරිනැමේ.

**1) පාසැල් ළමුන්ගේ පෝස්ටර් චිත්‍ර තරඟය**

* ප්‍රථම , දෙවන සහ තුන්වන ස්ථාන වලට පිළිවෙලින් රු. 3000/=, 1500/=, 1000/= බැගින් මුදල් ත්‍යාගද පදක්කමක් හා සහතිකයක් ද පිරිනැමේ.
* 4 සිට 10 දක්වා ස්ථාන වලට පදක්කමක් හා සහතිකයක් පිරිනැමේ

මීට අමතරව හොඳම නිර්මාණ වෙනුවෙන් සහතිකයක් පිරිනැමේ.



**ජයග්‍රාහකයින්ට සහතිකපත් හා ත්‍යාග ප්‍රදානය කොළඹ 7, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී 2004 සැප්තැම්බර් මස 11 පැවැත්වෙන 'ජාත්‍යන්තර සහල් වර්ෂය' සමරු උත්සවයේදී සිදු කෙරේ. සියලුම ජයග්‍රාහී නිර්මාණවල අයිතිය ශ්‍රී ලංකා - එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානය සතුවේ. තරඟකරුවන්ට තම නිර්මාණ 2004 අගෝස්තු මස 31 වන දිනට පෙර පහත ලිපිනයට තැපැල් මගින් එවීමට හෝ ගෙනවිත් බාර දීමට පිළිවන.**


ශ්‍රී ලංකා - එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානය

'සන්හෝ මැදුර",

නො: 658/83, මහවිල උද්‍යානය, බේස්ලයින් පාර,

කොළඹ 09. දුර: 011-2688606


ANCL


මාධ්‍ය අනුග්‍රහය

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම